# රණවිරු අප්පච්චි මගේ



පී. ඒ.ඊ. යෂේලි ගෝනගල

# රණවිරු අප්පච්චි මගේ





## පී. ඒ. ඊ යශේලි ගෝනගල

කතෘ

# කතෘගේ වෙනත් කෘති:




පුංචි දෝණී මං
2020 නොවැම්බර්




සොබාදහම නොකියු රහස්
2025 පෙබරවාරි




අක්කාගේ ආදරය
2025 පෙබරවාරි

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය
පංතිය : 7 – F
එළිදැක්වීම : 2026 ජූලි
ISBN :

# පිදුම...

ලේ, කඳුළු, දහඩිය

පමණක් නොව

අපව ද නොතකා

යුධ වැදුණු

මගේම වීරෝදාර

අප්පච්චිටත්

මහා මෙරක් බඳුවූ ආදරණීය

මහාමායා විදු මැණියන්ටත්

සාදරයෙන්

පිළිගන්වමි...!



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයෙන් දරුවන් ගත් කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවර ද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධන වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කර වූ හේමාමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මඟ පෙන්වූ ගුරු බවතුන් ඇතුළු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

## සුභාශිංසන පණිවිඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ හෙළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණය හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම සිසු දරුවන්ගේ දක්ෂතා නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය ගුරු මණ්ඩලය සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමින් මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීම උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
අණ්ඩුකාරවර, මධ්‍යම පලාත
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## සුභාශිංසන පණිවිඩය

වත්මන් පාසල් පද්ධතිය තුල දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූල්කත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගීත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල් වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැළසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියළු දෙනාගේ විශිෂ්ඨ වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියළු දරුවන්ට නිදහස්, අනිවාර්ය ගුණාත්මක හා සාධරණ අධ්‍යාපනයක් ලබා දීමටත් මෙමඟින් අනාගතයේදී බුද්ධිත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන් හේතුපාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්තකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව



ඉපදුන දින පටන්
මා සෙව්වේ ඔබයි
ළග නැතත් පියාණෙනි
මගේ ලෝකය ඔබයි

අම්මා කෝ අප්පච්චි
කවදාද එන්නේ යළි
අසයි මවගෙන් නිතර
මගේ පණ අප්පච්චි



යුද්ධය කියන්නේ කුමට

නොතේරේ පුංචි මට

ඒත් මව පවසාවි

මුහුදට ගිය බව මෙමට

මුහුදු යන ධීවරයො

මා දන්නේ එපමණය


එහෙත් දැන් මා හට

දැනේ යුද්ධෙක අරුත



අම්මාව බලා ගන්නයි
නංගිව බලා ගන්නයි
පවසමින් අයියාට පිටව යයි
මගේ ආදර පියා ඔහු වෙයි

හිස නමමි මම ඊට
නොතේරේ වගකීම
අතේ එල්ලී ඔහුගෙ
හඩා වැලපෙමි එවිට



| | |
|---|---|
| අප්පච්චි | බලන්න |
| යන්න ඕනෑලු | අයියාට |
| ඒ හින්දා | හෙලිකොප්ටර් |
| ගේන්නලු | අම්මාට |

| | |
|---|---|
| මවගේ දෑස් | කඳුලින්ය |
| මා දුටුව එය | හොඳට |
| අයියාව | සනසවා |
| සෙල්ලමක් කළෙමි | මම |



ටෙලිෆෝනය නාද වෙයි
අප දෙදෙනාම දිව යයි
ඇසුනු විට ඔබේ හඬ
ලොවම අමතකව යයි

අම්මා සැර උවද
අප්පච්චි නෑ එලෙස
චූටි සුදු දෝණී යැයි
අත ගායි මගේ සිරස



මොන්ටිසෝරි ගියාදා
මා එනතතුරු රැඳිලා
ජනේලෙන් බැලුවා
සිටියා ඔබ රැඳිලා

ටික දිනක් ඔබ සිටියද
ජනේලය දෙස බැලුවිට
නැති බව දැනී රුව
හැඬුවා අප්පච්චි මම




යහළුවො පියවරුගේ<br>
දෑතේ එල්ලීගෙන යති<br>
ඔබ ළඟ නැති අඩුව<br>
දැනේ පියතුමණී මට

රාජකාරිය නිමකොට<br>
එන්නේ ඔබ කවදාද<br>
දින ගනිමි පියතුමණී<br>
නිදි නැතිව හැමදාම



සතුරා ද මිනිසුන්ය
වෛරයම නොකරන්න
යුද්ධයද අවසන්ය
පවසන්නේ පියා මට

නාවික නිලධාරියෙකු වුවද
පියායි මට හැමවිටම
ඔබේ ඔය ගුණ දහම්
සැමදාම රකිමි මම



හදවතින් යුධ වැදුණා
බඩට කුස ගිනි දැනුණා
දිවා රෑ නිදි මැරුවා
ඔබව සිහියට නැගුනා

පවසයි පියා මා හට
දුක දැනෙයි මතක් වූ කළ
ඔබෙන් ලත් ආදරය
මහා සාගරයකි මට



දස මාසේ උරේකත්වා
කියා වඩිනෙමි මවට මම
ඒත් ඔබ එනතුරා
පීතු පාදං කියමි බුදුරුවට

විමසයි පියා ගැන
නෑදෑ මිතුරු කැල
දුක දැනෙයි හිතට මට
කඳුළු එයි නෙත් දෙකට



ගෙදර ආ විටදී ඔබ
අතේ එල්ලී මෙමා
අප්පච්චි යලි එපා
යන්න මතකද කියවනා

අනේ සුදූ අප්පච්චි
නිම කොට රාජකාරිය
දෝණී සහ පොඩි පුතුව
බලන්නට එනවාද

ඔබ මෙමට විරුවෙකි
දයාබර පිය රජිදෙකි
උපදිනා හැම බවදී
වෙන්න මගේ අප්පච්චි

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පරියේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්‍ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල් තාක්‍ෂණික මෙවලම් මෙන්ම පොත්පත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මක පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසා ය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමු.

සෙනවිරත්න මහා ලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN